" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.
ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

296

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.01.06 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්වු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2021.12.31 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2021.09.14<br>02-80/2021 | රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා වෛද්‍ය විද්‍යාල සභාව විසින් වසරක් පාසා පැවැත්විය යුතු ප්‍රවීණතා ඩිප්ලෝමා විභාගය 1997 වසරේ සිට නොපැවැත්වීම හේතුවෙන් සිදුවූ අසාධාරණය නිවැරදි කිරීම පිණිස ලියාපදිංචි වෛද්‍ය සේවයේ 1 වන ශ්‍රේණියට උසස් කිරීමට ගතවන කාලය සංශෝධනය කිරීම |
| 02 | 2021.12.20<br>රා.ප. චක්‍රලේඛ 25/2021 | 2022 වසර - රාජකාරී කටයුතු ඇරඹීම |
| 03 | 2021.11.22<br>රා.ප. චක්‍රලේඛ 22/2021 | රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය |
| 04 | 2021.12.24<br>රා.ප. චක්‍රලේඛ 26/2021 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2022 වසර |

| | | |
|---|---|---|
| 05 | 2021.11.24<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02-2021 | අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ නොකිරීම මත උසස්වීම් නොලබා විශ්‍රාම ගිය නිලධාරින් සඳහා ශ්‍රේණි උසස් වීම් ලබා දීම |

**02.** එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 25/2021

මගේ අංකය : EST-1/MISCL/06/0032(I)
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2021.12.20

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**2022 වසර - රාජකාරි කටයුතු ඇරඹීම**

කොවිඩ් - 19 ලෝක වසංගත තත්ත්වය හමුවේ එයට සාර්ථකව මුහුණ දෙමින්, 2021 වර්ෂය තුළ සුදුසුකම් ලත් සියලු ජනගහනය එන්නත්කරණයට ලක් කරමින් සහ මේ වන විට පරිපූරක (Booster) මාත්‍රාව ලබා දීමේ කටයුතු සීඝ්‍රයෙන් ක්‍රියාත්මක වන පරිසරයක් තුළ රට කඩිනමින් සාමාන්‍යකරණය වෙමින් පවතී. ජාතික සංවර්ධන වැඩපිළිවෙල තුළ දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇති කිරීම මූලික කර ගනිමින් කාබනික කෘෂිකර්මය හා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා භූමිය, ජලය හා හිරු එළිය තුළින් පෝෂණය වී ඇති ස්වභාවික සම්පත් ප්‍රශස්ත භාවිතයට ප්‍රමුඛත්වය දී ඇත. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුළ රාජ්‍ය සම්පත් හා රජයේ මුදල් ඵලදායී ලෙස පරිහරණය සම්බන්ධයෙන් මෙවර අයවැය මගින් දැඩි ලෙස අවධාරණය කර ඇති අතර, ඒ අනුව හැකිතාක් දුරට කටයුතු විමධ්‍යගත කරමින් අවම පිරිවැයක් තුළ සේවා සැපයීම් කාර්යක්ෂම කිරීම අවධාරණය කර ඇත. මෙම පැතිකඩයන් ඒකරාශී කරගනිමින් ජාතික නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගෘහ ආර්ථිකයන්ගේ සිට ඉහළ ව්‍යාපාර දක්වා පුළුල් වී ඇති ව්‍යාපාර ප්‍රජාව සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම රාජ්‍ය සේවයේ කාර්යභාරය වෙමින් පවතී.

02. එළඹෙන 2022 වසර තුළ සමාජ හා ආර්ථික අභිලාෂයන් ළඟා කර ගැනීමේ ඒකායන අභිප්‍රායෙන් යුක්තව සියලු ම රජයේ සේවකයන් විසින් රජයේ සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ යහපත උදෙසා කැපවීමෙන් වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. තව ද, 2020 - 2021 වසර දෙක තුළ කොවිඩ් - 19 වසංගතයෙන් පසුබෑමට ලක් වූ සමාජ ආර්ථික ප්‍රගතිය, 2022 තුළ යළි ඇති කරමින් ශක්තිමත් රටක් ගොඩනැගීම රාජ්‍ය සේවකයන්ගේ වගකීමකි. ඒ අනුව, 2022 වසරේ රාජකාරි අරඹන පළමු දිනය වන ජනවාරි මස 03 වන සඳුදා දින සියලුම රාජ්‍ය සේවකයන්ගේ සහභාගීත්වයෙන් සිය සේවා ස්ථානයන්හි මේ වෙනුවෙන් අවශ්‍ය මෙහෙයුම් දියත් කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

03. එහි ප්‍රධාන නිල උත්සවය එදින පෙ.ව. 9.00 ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත් වේ. ඊට සමගාමීව එදින එම වේලාවට ම පහත දැක්වෙන වැඩසටහන ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරන සියලු ම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ලබා දී ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා, පහත දැක්වෙන වැඩපිළිවෙල යොදා ගත යුතු වේ.

I. සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූල වන පරිදි සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නියෝජනය සහතික කෙරෙන විකල්ප වැඩපිළිවෙලවල් මඟින් ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

II. රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලුදෙනා සැමරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

III. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් තම ස්ථානවල සිට මේ සමඟ එවා ඇති රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නඟා කියවීම.

IV. වර්තමානයේ රට මුහුණ දී ඇති ප්‍රධාන සෞඛ්‍ය ගැටලුව වන කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම වළක්වා ගැනීම උදෙසා එක් එක් පුද්ගලයා සතුවත්, සමාජය සතුවත්, කාර්යාල පරිශ්‍ර තුළත් ඇති වගකීම අවධාරණය කෙරෙන කෙටි දේශනයක් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධරයෙකුගේ සම්පත් දායකත්වයෙන් පැවැත්වීම.

V. සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක, සාධාරණ සමාජයක් සහ නීල හරිත රටක් (Blue/Green Country) බිහි කිරීම සඳහා රට හදන සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සුවිශේෂී ප්‍රමුඛතා හා ඉලක්ක ඉටුකර ගැනීමට රාජ්‍ය සේවයේ දායකත්වය දැඩි කැපවීමකින් යුතුව ලබා දීමේ අවශ්‍යතාව තේමා කරගත්, රාජ්‍ය සේවකයන් අභිප්‍රේරණය කරන ආකාරයෙන් කෙටි දේශනයක් පැවැත්වීම.

04. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්

# <u>රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/ දිවුරුම</u>

දෙදහස් විසි දෙක වර්ෂයේ රාජකාරි අරඹන පළමු වැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ලක් වැසි ජනතා අපේක්ෂාවන්

යථාර්ථයක් බවට පත් කරන නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ, එක කොඩියක සෙවණේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන

සුරක්ෂිත වූ අපගේ මාතෘ භූමිය තුළ

රට හඳන සෞභාග්‍යයේ දැක්ම පෙරදැරි කරගත්

විනයගරුක, නීතිගරුක, ගුණගරුක සහ සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහි කිරීමට ද

තිරසර පරිසර කළමනාකරණය මුල්කොටගත්

භෞතික සම්පත් සංවර්ධනය තුළින්

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීමට ද

නූතන තාක්ෂණයෙන් සන්නද්ධ සශ්‍රීක මානව සම්පත මෙහෙයවන

පිරිසිදු රාජ්‍ය පාලනයක කොටස්කරුවෙකු වන මම,

මහජන මුදලින් වැටුප් ලබන රජයේ සේවකයෙකු ලෙස

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/ දිව්රුම් දෙමි.